ජනමාධ්‍ය නිවේදනය

තොරතුරු යථාවත් කිරීමේ පසු නව සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම අභියාචනා / විරෝධතා කැඳවීම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
දිනය - 2026.10.28

පසුබිම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2023. අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ආරම්භ කළ අතර අස්වැසුම පළමු අදියර සඳහා 3,366,789 ක් අයදුම්පත් ලැබූ අතර පවුල් 1,868,407 අස්වැසුම ප්‍රතිලාභ කාණ්ඩ 04 සඳහා සුදුසුකම් ලැබීය.

සුබසාධක ප්‍රතිලාභ පනතේ 23 වන වගන්තිය අනුව දැනට ප්‍රතිලාභ ලබන සහ නොලබන තැනැත්තන්ගේ නම් අවුරුද්දකට වරක් යථාවත් කිරීමට සැලැස්විය යුතුය. ඒ අනුව 2023 වසරේ අස්වැසුම පළමු අදියර ප්‍රතිලාභීන් / අයදුම්කරුවන් සඳහා තොරතුරු යථාවත් කිරීමට අවස්ථාවක් 2025/11/10 දින ලබා දෙන ලදී. ඒ අනුව අස්වැසුම පළමු අදියරේ 3,123,757 පවුල් ප්‍රමාණයක් තොරතුරු යථාවත් කිරීම සඳහා තම අභිමතය ප්‍රකාශ කළ අතර තොරතුරු යථාවත් කිරීමෙන් පසු සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය කොටස් 02 ක් ලෙස පළ කිරීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය තීරණය කර ඇත. එහිදී පළමු ලේඛණය සඳහා පාදක කර ගනු ලැබුවේ 2026 / 10 /27 දිනට වැඩ අවසන් පවුල් 2,383,630 කි.

2025 / 12 /15 දින අංක 2497/03 රජයේ ගැසට් නිවේදනය අනුව අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ දුප්පත් සහ අන්ත දුප්පත් කාණ්ඩ 02 සඳහා පමණි. ඒ අනුව තොරතුරු යථාවත් කිරීමෙන් පසු ඉහත කාණ්ඩ 02 යටතේ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබා ඇති මුළු සංඛ්‍යාව පහත පරිදිය.

කාණ්ඩය	**මාසික දීමනාවේ වටිනාකම (රු)**	**සුදුසුකම්ලාභීන් සංඛ්‍යාව**
අන්ත දිළිඳු	17500	363,142
දිළිඳු	10000	628,658
මුළු සුදුසුකම්ලාභීන් සංඛ්‍යාව (පළමු ලේඛනය)		991,800

ඉහත පළමු ලේඛන යටතේ 1,391,830 ක් අස්වැසුම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් නොලබයි.මෙම සුසුකම්නොලැබූ අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත්කිරීමට සුබසාධක ප්‍රතිලාභ පනතේ 11 වන වගන්තිය අනුව අවස්ථාව ඇති අතර ඒ සඳහා 2026.10.29 සිට 2026.11.11 දක්වා කාලයක් ලබා දී ඇත.එමෙන්ම තමා තේරී ඇති කාණ්ඩය පිළිබඳ සෑහීමකට පත් නොවන සුදුසුකම්ලාභීන්ටද අභියාචනා ඉදිරිපත්කිරීමට අවස්තාව ඇත.

පළමු නාම ලේඛනය යටතේ සුදුසුකම්ලබා ඇති පවුල් 991,800 පිළිබඳ මහජන විරෝධතා ගොනු කිරීමට අවස්ථාව ඇත. සුදුසුකම්ලාභින්ගේ නාම ලේඛනයේ සිටින අස්වැසුම ප්‍රතිලාභ ලැබීමට

නොසුදුසු යැයි හැඟෙන පවුල් සහ පුද්ගලයන් පිළිබඳ මහජනතාවට විරෝධතා ගොනු කල හැක. නිර්නාමිකව ද විරෝධතා ඉදිරිපත්කල හැකිය.

තොරතුරු යථාවත් කිරීමෙන් පසු නව සුදුසුකම්ලාභීන්ගේ දෙවන නාම ලේඛනය 2026 දෙසැම්බර් මස ප්‍රසිද්ධ කිරීමට බලාපොරොත්තු වේ. සුදුසුකම්ලාභීන්ගේ දෙවන නාම ලේඛනය සඳහා පාදක කර ගනු ලබනුයේ පවුල් 740,127 කි.

<u>සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම.</u>

- සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ ග්‍රාම නිලධාරී වසම් කාර්යාලවල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර ඇත.
- සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.wbb.gov.lk නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇත.

<u>අභියාචනා / විරෝධතා කැඳවීම</u>

- අභියාචනා / විරෝධතා කැඳවීම 2026.10.29 සිට 2026.11.11 දින දක්වා
- මාර්ගගතව අභියාචනා / විරෝධතා ඉදිරිපත් කිරීමට eservices.wbb.gov.lk වෙත පිවිසෙන්න.
- අයදුම්පත් මගින් අභියාචනා / විරෝධතා ගොනු කළ හැක. අයදුම්පත් බාගත කර ගැනීමට www.wbb.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න එසේ නැතහොත් තමා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකයෙන් ලබාගන්න.
- එක් අභියාචනාකරුවෙකුට ඉදිරිපත් කල හැක්කේ එක් අභියාචනාවක් පමණි.
- මහජන විරෝධතා නිර්ණාමික ද ගොනු කළ හැක.

<u>නව සුදුසුකම්ලාභීන් සඳහා ප්‍රතිලාභ දීමනා ගෙවීම</u>

- 2026.11.27 වන දා ප්‍රතිලාභ බැංකු ගත කෙරේ
- බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ලිපි නිකුත් කිරීම 2026.11.12 සිට
- ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ අස්වැසුම බැංකු ගිණුම් වෙත පමණි.

නිමල් කොටවලගෙදර
සභාපති / කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය